සැ. යු. -2009.04.24 දින පළ වූ අංක 1,599 දරන ගැසට් පත්‍රයේ I/III (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,600 - 2009 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2009.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | රජයේ නිවේදන ... ... ... | 534 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 534 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 මැයි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 අප්‍රේල් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# රජයේ නිවේදන

### සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 වැනි අධිකාරය) 3 සහ 4 වැනි වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, අලෙවි සංවර්ධන සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍ය සුමිත්‍ර ආරච්චිගේ දොන් බන්දුල චන්ද්‍රසිරි ගුණවර්ධන වන මම මෙම නිවේදනයෙන්,

01. ආදි ශිෂ්‍ය මූලස්ථානය, 'ආදි සිසු සෙවන', ධර්මපාල විද්‍යාලය, හයිලෙවල් පාර, පන්නිපිටිය, දරන ස්ථානයේ පිහිටි "ඩිවලොප්මන්ට් ට්‍රස්ට් ෆන්ඩ් ඔෆ් ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය" නමැති සමිතිය, සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙ හි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි.

02. සමිති ආඥාපනත 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනතේ අදාළ කිරීම් එකී සමිතියට සීමා කරමි.

සුමිත්‍ර ආරච්චිගේ දොන් බන්දුල චන්ද්‍රසිරි ගුණවර්ධන,
වෙළඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍ය.

2009 මාර්තු මස 06 වැනි දින,
වෙළඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා
පාරිභෝගික සේවා අමාත්‍යාංශය,
අංක 330, යූනියන් පෙදෙස,
කොළඹ 02.

04-653

### 2009 යල් කන්න රැස්වීම - තල්දෙන ව්‍යාපාරය

තල්දෙන ව්‍යාපාරයේ 2009.03.23 වැනි දින පැවති කන්න රැස්වීමේදී ගන්නා ලද තීරණ පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 01. වගා කරන බිම් ප්‍රමාණය | | : අක්කර 350 |
| 02. වගා කරන බෝග | පුස්සැල්ලාව | - අතුරු බෝග |
| | බෝලියද්ද | - අතුරු බෝග |
| | තල්දෙන | - අතුරු බෝග |
| 03. ඇල වේලි ශුද්ධ කරන අවසන් දිනය | | : 2009 මාර්තු මස 31 වැනි දිනට පෙර |
| 04. ජලය නිකුත් කරන ආරම්භක දිනය | | : 2009 අප්‍රේල් 01 |
| 05. බෝග සිටුවා අවසන් කරන දිනය | | : |
| | 1. තල්දෙන | - 2009.04.30 |
| | 2. බෝලියද්ද | - 2009.05.30 |
| | 3. පුස්සැල්ලාව | - 2009.06.15 |
| 06. අවසන් ජල මුරය නිකුත් කරන දිනය | | : 2009.08.15 |
| 07. අස්වැන්න නෙලා අවසන් කරන දිනය | | : 2009.08.30 |
| 08. ඇල වේලි ශුද්ධ නොකිරීමේ දඩ මුදල | | : පැලකට රු. 500 |
| 09. යායෙන් ගවයින් පිට කරන දිනය | | : 2009.04.01 |
| 10. යායට ගවයින් ඇතුළු කරන දිනය | | : 2009.08.30 |

ආර්. ඒ. චූලානන්ද,
ප්‍රාදේශීය ලේකම්-සොරණාතොට,

2009 අප්‍රේල් මස 08 වැනි දින,
සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-612

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - වත්තල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, රැල්ෆ් හර්බට් ද ෆ්‍රයි සහ ෂෙරිල් ප්‍රැන්සිස් ද ෆ්‍රයි විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1531 සහ 2005 ජනවාරි මස 11 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත 2008 ඔක්තෝබර් මස 31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හාරලක්ෂ හතළිස් එක් දහස් පන්සිය අනූපහයි ශත තිස්හය (රු. 4,41,595.36) ක මුදල සහ 2008 නොවැම්බර් මස 01 වැනි දින සිට එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් හාර ලක්ෂ හතළිස් දහස් එකසිය හතළිස් තුනයි ශත අනූ පහ (රු. 4,40,143.95)ක මුදල මත වර්ෂයකට 28% බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 1531 සහ 2183 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් හාරලක්ෂ හතළිස් එක් දහස් පන්සිය අනූ පහයි ශත තිස් හය (රු. 4,41,595.36)ක මුදල සහ 2009 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහානාම ඩ්‍රයිව්හි අංක 474, මහානාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකාර වන රංජිත එස්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස

උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභාවේ (වත්තල උප කාර්යාල) සීමාව තුළ වැලිසර පිහිටි කුරුඳුවත්ත පාර 1 වැනි පටුමග, වරිපනම් අංක 46 දරන වැලිසර හෙවත් වැලිසර සිනමන් එස්ටේට්ස් යන ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද අංක 2146 සහ 1961.08.20 වැනි දින දරන සැලැස්මේ ලොට් 19හි නැගෙනහිර කොටස වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : ලොට් ඩී, නැගෙනහිරට : ලොට් අයි, දකුණට : ලොට් 38 සහ බස්නාහිරට : ලොට් 19හි ඉතිරි කොටස (බස්නාහිර කොටස) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) ක් විශාල බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි නිවස, ගහකොළ, පළතුරු ආදී සියළු දේ වේ.

එකී ලොට් 19හි නැගෙනහිර කොටස මෑතකදී යලි මනින ලදුව පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභාවේ (වත්තල උප කාර්යාල) සීමාව තුළ වැලිසර පිහිටි කුරුඳුවත්ත පාර, 1 වැනි පටුමග වරිපනම් අංක 46 (කොටසක්) දරන වැලිසර හෙවත් වැලිසර සිනමන් එස්ටේට්ස් යන ඉඩමට (බලයලත් මිනින්දෝර වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද අංක 2146 සහ 1961.08.20 වැනි දින දරන සැලැස්මේ ලොට් 19හි බෙදා වෙන් කරන ලද කොටසක් වන) බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න විසින් මැන සාදන ලද අංක 353/2004 සහ 2004.11.07 දරන සැලැස්මේ ලොට් 19බී දරන කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට : කුරුඳුවත්ත පාර, නැගෙනහිරට : අංක 2146 සැලැස්මේ ලොට් අයි, දකුණට : අංක 2146 සැලැස්මේ ලොට් 38 සහ බස්නාහිරට : අංක 353/2004 සැලැස්මේ ලොට් 19ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම හැත්තෑ පහ (අ. 0, රූ. 0, පර්. 14.75) ක් විශාල බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි නිවස, ගහකොළ, පළතුරු ආදී සියළු දේ වේ. ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 158/216 හි ලියාපදිංචි කර ඇත.

අංක 2146 සැලැස්මේ ලොට් A, C, D, I සහ N මත මාර්ග අයිතිය ද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ණය අයකර ගැනීම්.

04-651/2

---

## පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - වත්තල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, උඩුවේ විදානලාගේ දොන් තෝමස් අර්නස්ට් විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 2610 සහ 2008 මාර්තු මස 19 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත

(අ) 2009.01.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දෙලක්ෂ පනස් පන්දහස් හාරසියය තිස් හතරයි ශත හැත්තෑ නමය (රු. 2,55,434.79)ක මුදල සහ 2009.02.01 වැනි දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් දෙලක්ෂ පනස් දහස (රු. 2,50,000) ක මුදල මත වර්ෂයකට 25% බැගින් පොළිය ද, සහ රුපියල් දෙලක්ෂ පනස් දහස (රු. 2,50,000) ක මුදල් ඉක්මවන මුදල මත වර්ෂයකට 38% බැගින් පොළිය ද,

(ආ) 2009.02.24 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හයලක්ෂ පනස් නම දහස් හය සිය හැත්තෑවයි ශත අසූපහ (රු. 6,59,670.85)ක මුදල සහ 2009.02.25 වැනි දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කර දිනය තෙක් රුපියල් හයලක්ෂ හතලිස් පන් දහස් දෙසීය අනූ එකයි ශත තිස්අට (රු. 6,45,291.38)ක මුදල මත වර්ෂයකට 29% බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ, ඒ කෙසේද යත්,

එකී අංක 2610 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් නම ලක්ෂ පහළොස් දහස් එකසියය පහයි ශත හැට හතර (රු. 9,15,105.64)ක මුදල සහ ඉහත කී දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව් අංක 474 මහනාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකාර වන රංජිත එස්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස

උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ දලුගම ග්‍රාමයෙහි පිහිටි පරණ නුවර පාර වරිපනම් අංක 165 දරන (බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද අංක 297/1985 සහ 1985.08.24 වැනි දින දරන සැලැස්මේ ලොට් 'ඒ' බිම් කැබැල්ලෙහි බෙදා වෙන් කරන ලද කොටසක් වන) මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. විජේතුංග විසින් මැන සාදන ලද අංක 425/99 සහ 2008.03.16 වඩාත් නිවැරදි ලෙස 1999.04.18 දිනැති සැලැස්මේ ලොට් 3 වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඊසානදිගට : ලොට් 4 සහ අංක 297/1985 සැලැස්මේ ලොට් 'බී' දරන කැබැල්ලේ ඉතිරි කොටස, ගිණිකොණට : ලොට් 5, නිරිතදිගට : ලොට් 2 සහ වයඹට : පරණ නුවර පාර සහ ලොට් 4 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහනමයයි දශම හයයි නමය (අ. 0, රූ. 0, පර්. 19.69)ක් හෝ හෙක්ටයාර් 0.04981 ක්

විශාල බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලු දේ වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 714/110හි ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ දලුගම ග්‍රාමයෙහි පිහිටි පරණ නුවර පාර වරිපනම් අංක 165 දරන (බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද අංක 297/1985 සහ 1985.08.24 වැනි දින දරන සැලැස්මේ ලොට් 'ඒ' බිම් කැබැල්ලෙහි බෙදා වෙන් කරන ලද කොටසක් වන) මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. විජේතුංග විසින් මැන සාදන ලද අංක 425/99 සහ 2008.03.16 වඩාත් නිවැරදි ලෙස 1999.04.18 දිනැති සැලැස්මේ ලොට් 7 වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඊසානදිගට : ලොට් 2 සහ 6, ගිණිකොණට : යූ. ඩී. තෝමස්ගේ ඉඩම, නිරිතදිගට : මාරසිංහගේ ඉඩම සහ වයඹට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහනමයයි දශම පහයි හය (අ. 0, රූ. 0, පර්. 19.56)ක් හෝ හෙක්ටයාර් 0.04948ක් විශාල බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලු දේ වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 714/111හි ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුණ දලුගම ග්‍රාමයෙහි පිහිටි පරණ නුවර පාර වරිපනම් අංක 165 දරන (බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද අංක 297/1985 සහ 1985.08.24 දින දරන සැලැස්මේ ලොට් 'ඒ' බිම් කැබැල්ලෙහි බෙදා වෙන් කරන ලද කොටසක් වන එකී අංක 425/99 සැලැස්මේ ලොට් 1 හි බෙදා වෙන් කරන ලද කොටසක් වන) මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. විජේතුංග විසින් මැන සාදන ලද අංක 425/99 සහ 2008.03.16 වඩාත් නිවැරදි ලෙස 1999.04.18 දිනැති සැලැස්මෙහි එකී බලයලත් මිනින්දෝරු තැන විසින් 2008.03.16 වැනි දින බෙදා වෙන් කිරීමේ පිටසන අනුව ලොට් 1සී වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඊසානදිගට : අංක 425/99 සැලැස්මේ ලොට් 2, ගිණිකොනට : අංක 425/99 සැලැස්මේ ලොට් 7, නිරිතදිගට : මාරසිංහගේ ඉඩම සහ වයඹට : ලොට් 1බී යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම හයයි නමය (අ. 0, රූ. 0, පර්. 1.69) ක් හෝ හෙක්ටයාර් 0.00428ක් විශාල බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලු දේ වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 714/112හි ලියාපදිංචි කර ඇත.

අංක 425/99 සැලැස්මේ ලොට් 2 දරන බිම් කැබැල්ල මත මාර්ග අයිතිය ද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ණය අයකර ගැනීම්.

04-651/1

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 128845 සහ 1280022501.

2008 දෙසැම්බර් මස 22 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. පී. එස්. කරුණානායක විසින් 2002 අප්‍රේල් මස 02 වැනි දින සහතික කරන ලද අංක 2314 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වැලිගමගේ සිසිර කවිමාදි ආරියරත්න ද සිල්වා සහ බාලගේ දොන් සැම්සන් සිල්වා ණයකරුවන්/උකස්කරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහතර ලක්ෂ විසිඑක් දහස් පන්සිය තිස්පහයි ශත හතලිස් හයක (රු. 24,21,535.46) මුදලක් 2008 නොවැම්බර් මස 06 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් විසිහතර ලක්ෂ විසිඑක් දහස් පන්සිය තිස්පහයි ශත හතලිස් හයක (රු. 24,21,535.46) මුදලට 2008 නොවැම්බර් මස 07 වැනි දින සිට දේපළ විකිණීමේ දිනට දක්වා කාලයට රු. 16,60,126.83ක මුදල මත 28%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 2314 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ස්ඩොර්ප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක අජිත් රන්ජන් වීරසූරිය විසින් 1994 අගෝස්තු මස 09 වැනි දින සාදන ලද අංක 772 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුව, හබරාදුව කතළුව ප්‍රාදේශීය සභාවේ උප කාර්යාලය සීමාව තුළ කතළුව පිහිටි මලපලාහයියාරෙවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් ඒ1 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 772 දරන පිඹුරේ ලොට් ඒ2 ද, නැගෙනහිරට : එකී අංක 772 දරන පිඹුරේ ලොට් ඒ2 ද සහ මලපලාහයියාරෙවත්ත ඉඩමේ කොටසක් ද, දකුණට : මලපලහයියාරෙවත්ත ද, සහ බස්නාහිරට : මලපලහයියාරවත්තේ කොටසක් ද, කබලාන පාර ද යන මායිම් තුළ පර්චස් විසි නවයයි දශම පහයි තුනක් (අ. 0, රූ. 0, පර්. 29.53) විශාල ඉඩම අංක 772 දරන පිඹුර පරිදි ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 773/76 යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

04-643

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1440008608.

2008 දෙසැම්බර් මස 02 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ගනේපොල විසින් 2005 දෙසැම්බර් මස 16 වැනි දින සහතික කරන ලද අංක 10420 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අරන්ගලගේ දෝන මිහිරි පෙරේරා සහ පොන්නම්පෙරුම ආරච්චිගේ සේනක සෙනෙවිරත්න ණයකරුවන්/උකස්කරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්සිය හැට පන්දහස් අටසිය අනූවයි ශත විස්සක (රු. 3,65,890.20) මුදලක් 2008 ජූනි මස 09 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් තුන්සිය හැට පන්දහස් අටසිය අනූවයි ශත විස්සක (රු. 3,65,890.20) මුදලට 2008 ජූනි මස 10 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට (රු. 3,65,890.20) මුදලට 2008 ජූනි මස 10 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 3,65,890.20ක මුදල මත 33%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 10420 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ස්ඩෝප් වීදියේ, අංක 99 හි ප්‍රසිද්ධ වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක යූ. එච් බී. කේ. එම්. ටී. අනගම්මාන විසින් 1999 නොවැම්බර් මස 25 වැනි දින සාදන ලද අංක 521 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, යටිගහපත්තු හාපිටිගම් කෝරළේ, සහ උඩුගහපත්තු ඇලපිටියාව සහ හල්පේ පිහිටි කටුකුරුඳුගහයාය ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 109 දරන ඉඩමට මායිම්, උතුරට : ලොට් 120 (වඩාත් නිවැරදිව ඇල මාර්ගය සහ ලොට් 120) ද, නැගෙනහිරට : (අඩි 20ක් පළල පිවිසෙන මාර්ගය වන ලොට් 73 ද, දකුණට : ලොට් 108 ද, බස්නාහිරට : ඇල මාර්ගය ද, යන මායිම් තුළ පර්චස් දොළහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 12.5) විශාල ඉඩම. මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 291/205 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

04-642

---

### මහජන බැංකුව - කොබෙයිගනේ ශාඛාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.05 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ප්‍රසිද්ධ නොතාරිස් අනුපමා ප්‍රියදර්ශනී මුහන්දිරම් මහත්මිය විසින් සහතික කරන ලද 2005.12.22 දිනැති අංක 3527 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් ජයසුන්දර මුදියන්සේලාගේ මංජුල ප්‍රියදර්ශන ජයසුන්දර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ දස දහස් හතලිස් හතක (රු. 3,10,047) මුදලක් දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.03.03 වැනි දින සිට වර්ෂයකට සියයට දහනවයයි දශම පහ (19.5%) බැගින් රුපියල් තුන්ලක්ෂ දස දහස් හතලිස් හතක (රු. 3,10,047) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාළ මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් තුන්ලක්ෂ දස දහස් හතලිස් හතක (රු. 3,10,047) මුදල අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම මහතා විසින් එකී අංක 3527 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ 29ඩී (29D) වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත් පත්තුවේ, බලදොර කෝරළේ, කඳත්තාව ගමෙහි පිහිටි රජයේ ඉඩම නම් ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. සිරිසේන මහතා විසින් 2005.06.20 වැනි දින සාදන ලද අංක 6566 දරන පිඹුරේ කැබලි අංක 01 දරන බිම් කොටස සහ එහි පිහිටි ගසකොළ, පළතුරු ආදී සෑම සියලු දේ. ඉඩමට මායිම්, ලොට් 2 උතුරට : මරක්කලගම වැව රක්ෂිතය, නැගෙනහිරට : කොබෙයිගනේ සිට විතිකුලිය දක්වා යන ප්‍රධාන පාර ද, දකුණට : තෙලහැර සිට ප්‍රාදේශීය සභා පාර, බස්නාහිරට : ඇල ද යන මෙකී මායිම් තුළ වූ අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාල ඉඩම හා ඒ තුළ පිහිටි ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ.

(මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ කේයූ/කේඕ/10/219 හි ලියාපදිංචි වී ඇත)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,

කලාපීය සහකාර සාමාන්‍යාධිකාරි,
(වයඹ කලාපය).

මහජන බැංකුව,
වයඹ කලාප කාර්යාලය,
අංක 210, කොළඹ පාර,
වැහැර,
කුරුණෑගල.

04-627

### මහජන බැංකුව - හිඟුරක්ගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.07.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් පද්මිණී අත්තනායක විසින් සහතික කරන ලද 2000.07.13 දිනැති අංක 181 සහ 182 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්, අබ්දුල් හසාන් සාජහාන් මයා සහ අබ්දුල් හසාන් රම්සීන් මයා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර යටතේ දැනට පිළිවෙලින් රුපියල් තිස් හත්ලක්ෂ පනස් දහස (රු. 37,50,000) ක් සහ රුපියල් හැටඑක් ලක්ෂ තිස් අටදහස් අටසිය හැට අටයි ශත හැත්තෑපහ (රු. 61,38,868.75) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2004.07.01 සිට වර්ෂයකට 29% බැගින් රුපියල් තිස්හත් ලක්ෂ පනස් දහස (රු. 37,50,000) ක මුදල සහ 2001.12.27 සිට වර්ෂයකට 34% බැගින් රුපියල් හැට එක් ලක්ෂ තිස් අටදහස් අටසිය හැට අටයි ශත හැත්තෑපහ (රු. 61,38,868.75)ක මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තිස්හත් ලක්ෂ පනස් දහස (රු. 37,50,000) ක් සහ රුපියල් හැට එක් ලක්ෂ තිස් අටදහස් අටසිය හැටඅටයි ශත හැත්තෑපහ (රු. 61,38,868.75) ක මුදල් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 181 සහ 182 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

1. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව පළාතේ, සිංහල පත්තුවේ, මින්නේරිය තුලානේ, මින්නේරිය ගමේ පිහිටි ගෙදරවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. දොලොස්වල මහතා විසින් 1986.10.12 වැනි දින මැන සාදන ලද අංක 4178 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01ට මායිම්, උතුරට : මින්නේරිය ඔය ද, නැගෙනහිරට : ලොට් අංක 02 ද, දකුණට : පාර ද, බස්නාහිරට : 1971.05.25 දිනැති අංක 407 දරන පිඹුරේ ලොට් අංක 4 ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් පහළොව (අ. 0, රූ. 1, පර්. 15) ක් විශාල ඉඩම හා එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ. මෙම ඉඩම පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 15/229 හි ලියාපදිංචි කර ඇත.

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව පළාතේ, සිංහල පත්තුවේ, මින්නේරිය තුලානේ, මින්නේරිය ගමේ පිහිටි ගෙදරවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඒ. දොලොස්වල මහතා විසින් 1986.10.12 වැනි දින මැන සාදන ලද අංක 4178 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 02 සහ 03 ට මායිම්, උතුරට : මින්නේරිය ඔය ද, නැගෙනහිරට : හබරණ සිට පොළොන්නරුවට දිවෙන පාර ද, දකුණට : පාර ද, බස්නාහිරට : ලොට් අංක 01 ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි, පර්චස් තිස්දෙක (අ. 0, රූ. 2, පර්. 32) ක් විශාල ඉඩම හා එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ. මෙම ඉඩම පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 15/230 හි ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩගම්පහ, හාරිස්පත්තුව, අකුරණ වරාගස්හින්න නමැති ගමේ පිහිටි ගම්මහගේ කොටුව කියන වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. සී. ඕ. ද ලා මෝට්ටේ මහතා විසින් මැන සකසන ලද 1970.09.15 සහ 1970.09.26 දිනති අංක 4085 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 ට මායිම්, උතුරට : එම්. ඒ. සුලෙයිමාන් ලෙබ්බේ දැනට අයිෂා උම්මාට අයිති ඉඩම ද, නැගෙනහිරට : එස්. ඒ. ලතීෆ් උම්මාට අයිති ගම්මහගේ කොටුව කියන වත්තේ ඉතිරි කොටස ද, දකුණට : ඉහත පිඹුරේ ලොට් අංක 02 ද, බස්නාහිරට : ඉහත පිඹුරේ ලොට් අංක 03 ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිදෙක (අ. 0, රූ. 0, පර්. 22) ක් විශාල වූ ඉඩම හා ඊට අයිති සියලු දේත් වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එච් 374/372 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
උතුරු මැද කලාපය.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නව නගරය,
පොළොන්නරුව.

දුරකථන අංක : 027-2224404, 2225760, 2223900, 2223522
ෆැක්ස් : 027-2223522
ඊ-මේල් : pol@rho.peoplesbank.lk

04-626

---

### මහජන බැංකුව - පොළොන්නරුව නගර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.02.29 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් පද්මිණී අත්තනායක විසින් සහතික කරන ලද 2000.01.13 දිනැති අංක 49 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, රණවීර මුදියන්සේලාගේ ආරියසේන මයා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් පන් ලක්ෂයක (රු 5,00,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2004.07.01 දින සිට වර්ෂයකට 26.5% බැගින් රුපියල් පන්ලක්ෂය (රු. 5,00,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පන් ලක්ෂය (රු. 5,00,000) ක මුදල අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 49 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ලංකාපුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, මැද පත්තුවේ, 75 ඒ ඕනෑගම

ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඕනෑගම නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක අ. ජ. පි. පො. 93 (අතිරේක අංක 01) දරන පිඹුරෙහි අංක 76 දරන 5 වත්ත නමැති ඉඩමට මායිම්, උතුරට : ලොට් අංක 35 සහ 75 ද, නැගෙනහිරට : ලොට් අංක 75 ද, දකුණට : ලොට් අංක 42 ද, බස්නාහිරට : ලොට් අංක 35 ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර තුනයි, රූඩ් දෙකයි, පර්චස් තිස් එක (අ. 3, රූ. 2, පර්. 31) ක් විශාල ඉඩම හා එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ. මෙම දේපළ පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 1/3/6/169 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නව නගරය,
පොළොන්නරුව.

දුරකථන අංක : 027-2224404, 2225760, 2223900, 2223522.
ෆැක්ස් : 027-2223522.
ඊ-මේල් : pol@rho.peoplesbank.lk

04-622

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් - මහනුවර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, අනාස් ට්‍රේඩර්ස් හි තනි අයිතිකරු වන අබ්දුල් ලතීෆ් මොහොමඩ් අනාස් සහ පාතිමා ෆසීනා කාදර් බන්ධනදායියන් වශයෙන් ද, පාතිමා ෆසීනා කාදර් උකස්කරු වශයෙන් ද, කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් වී. පී. දිසානායක විසින් සහතික කරන ලද අංක 1870 සහ 2005 මාර්තු මස 14 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත

(අ) 2009.01.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හතලිස් තුන්ලක්ෂ පනස් අට දහස් නමසිය විසි නමයයි ශත විසිපහ (රු. 43,58,929.25) ක මුදල සහ 2009.02.01 වැනි දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් හතලිස් ලක්ෂයක (රු. 40,00,000) ක මුදල මත වර්ෂයකට 26% බැගින් පොළිය ද, සහ රුපියල් හතලිස් ලක්ෂය (රු. 40,00,000) ඉක්මවන මුදල මත වර්ෂයකට 38% බැගින් පොළිය ද,

(ආ) 2009.02.23 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දහසය ලක්ෂ හතලිස් අට දහස් එකයි ශත එකොළහ (රු. 16,48,001.11) ක මුදල සහ 2009.02.24 වැනි දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් දාහතර ලක්ෂ අසූහය දහස් දෙසියය විසි හයයි ශත තිස් නමය (රු. 14,86,226.39) ක මුදල මත වර්ෂයකට 29% බැගින් පොළිය ද,

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ, ඒ කෙසේද යත්

එකී අංක 1870 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හැටලක්ෂ හය දහස් නමසිය තිහයි ශත තිස්හය (රු. 60,06,930.36) ක මුදල සහ ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහානාම ඩ්‍රයිව් අංක 474, මහනාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකාර වන රංජිත එස්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස.

**ඉහත සඳහන් උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහා නගර සභා සීමාව තුළ පිහිටි මහනුවර බලයලත් මිනින්දෝරු සී. පාලමකුඹුර විසින් මැන සාදන ලද අංක 1476 සහ 1984 අගෝස්තු මස 16 දිනැති සැලැස්මේ දැක්වෙන පෙර ත්‍රිකුණාමලය වීදිය සහ දැනට මහනුවර ඩී. එස්. සේනානායක වීදියේ වරිපනම් අංක 347 දරන උතුරට : ඩී. එස්. සේනානායක වීදියේ (පෙර ත්‍රිකුණාමල වීදිය) අංක 349 දරන පරිශ්‍රය, නැගෙනහිරට : ඩී. එස්. සේනානායක වීදිය (පෙර ත්‍රිකුණාමල වීදිය), දකුණට : ඩී. එස්. සේනානායක වීදියේ වරිපනම් අංක 345 දරන පරිශ්‍රය සහ බස්නාහිරට : කාණුව යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම තුනයි හතයි පහක (අ. 0. රූ. 0, පර්. 13.375) ක් හෝ හෙක්ටයාර් 0.033828 ක් විශාල ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි සහ ගහ කොළ ආදී සියලු දේ වේ. මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 206/69 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ණය අයකර ගැනීම්.

04-651/9

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් - කොටහේන ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන්

සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, හුසෙයින් මොහොමඩ් උවෙයිස් හෙවත් අඩප්පයලාගෙදර හුසෙයින් ලෙබ්බෙගේ පුතනුවන් වන මොහොමඩ් උවෙයිස් සහ මොහොමඩ් කාසිම් සරුක් මොහොමඩ් බන්ධනදායියන් වශයෙන් ද, හුසෙයින් මොහොමදු උවෙයිස් හෙවත් අඩප්පයලාගෙදර හුසෙයින් ලෙබ්බෙගේ පුතනුවන් වන මොහොමඩ් උවෙයිස් උකස්කරු වශයෙන් ද, කලින් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. බී. විජේරත්න විසින් සහතික කරන ලද අංක 1537 සහ 2007 දෙසැම්බර් මස 18 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත 2008.10.08 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දසලක්ෂ හැත්තෑ පන් දහස් හත්සිය අනූ හතයි ශත හැත්තෑ හත (රු. 10,75,797.77)ක මුදල සහ 2008.10.09 වැනි දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් නම ලක්ෂ තිස් හතර දහස් දෙසිය හතලිස් පහයි ශත හැත්තෑ හතර (රු. 9,34,245.74) ක මුදල මත වර්ෂයකට 29% බැගින් පොළිය ද, පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ, ඒ කෙසේද යත්,

එකී අංක 1537 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් දසලක්ෂ හැත්තෑ පන් දහස් හත්සිය අනූ හතයි ශත හැත්තෑ හත (රු. 10,75,797.77)ක මුදල සහ 2008.10.09 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව් අංක 474 මහනාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන රංජිත එස්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස,

### උපලේඛනය

